ලේඛන එතීම සහ flag දැමීම	47, 41, 36, 71, 42, 22, 20, 57, 63, 187, 151, 49, 32, 113, 287, 224, 216, 92, 91, 76, 69, 82, 382, 31, 37, 78, 10, 90
ලේඛන අනුපිළිවෙලට සැකසීම	41, 47, 36, 71, 42, 57, 63, 187, 151, 113, 32, 287, 216, 69, 224, 76, 91, 382, 82, 31, 49, 57, 10, 37, 78
ලේඛන පෙට්ටි වලට දැමීම හා රාක්ක මත ඇසිරීමේ කටයුතු සිදු කිරීම	41, 47, 36, 71, 42, 20, 57, 63, 187, 22, 151, 113, 287, 32, 216, 224, 76, 69, 91, 382, 82, 49, 31, 37, 10, 90, 78
සුචිපත්‍ර ලිවීම සහ පරිගණකගත කිරීම	36, 47, 22, 57, 187, 63, 287, 32, 113, 151, 49, 216, 42, 224, 91, 42, 41, 382, 82, 31, 37, 10, 90, 78
ලේඛන පරීක්ෂණ ලැයිස්තු සකස් කිරීම	31, 47, 53, 63, 71, 10, 216, 224, 287, 382, 41, 90, 91, 199, 82, 76, 92, 32, 78, 187, 151, 113, 24, 30, 28, 69, 59, 37, 36, 34, 49, 33, 35, 42
අදාළ කෝෂ්ඨාගාර වෙත ලේඛන මාරු කිරීම	75, 25.198, 25.34, 25.97, 25.80, 25.6, 234, 99, 70, 55, 106, 101, 77, 56, 257, 365, 352, 161, 98, 370, 267, 182, 62, 85, 43, 45, 01, 68, 26, 62.01, 107, 87, 64
වෙනත් කෝෂ්ඨාගාර වෙතින් ලේඛන ලබා ගැනීම	47, 49, 38, 37, 36, 35, 34, 33, 30, 22, 20, 17, 53, 57, 63, 71.1, 72, 72.1, 76, 78, 82, 83, 91, 113, 119, 160, 151, 165, 199, 220, 436, 275, 287, 382, 41, 66
පර්යේෂණ කාමරයට ලේඛන 830 ක් පමණ නිකුත් කිරීම.	
දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරිශීලනයට ලේඛන 200 ක් පමණ නිකුත් කිරීම.	
ලේඛන කාණ්ඩ අංක 31, 47, 53, 63, 71, 10, 216, 224, 287, 382, 41, 90, 91, 82, 76, 92, 32, 78, 187, 151, 113, 24, 28, 37, 36 සහ 49 සඳහා අදාළ සියලුම කාර්යයන් සිදුකර අවසන්කර ඇත.	
ලේඛන 05 ක් පමණ සංරක්ෂණය සඳහා යැවීම.	
ලේඛන පිරිසිදු කිරීම, රාක්ක පිරිසිදු කිරීම සහ කෝෂ්ඨාගාරය පිරිසිදු කිරීමේ කටයුතු නිරන්තරයෙන් සිදු කිරීම.	



කෝෂ්ඨාගාර



කෝෂ්ඨාගාර

6.4 සිතියම් අංශය

2018 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ඓතිහාසික සිතියම් එකතුව අංකිතකරණය කිරීම කරන ලදී. සමහර සිතියම් තනි පිටු වශයෙන් තිබුණ ද සමහර සිතියම් පිටු කීපයකින් යුක්තය. සිතියම් වර්ගීකරණය අනුව අංකිතකරණය කරන ලද පිටු ගණන පහත දක්වා ඇත.

ඓතිහාසික සිතියම්	55	මාතර සිතියම්	13
සාමාන්‍ය සිතියම්	50	මීගමුව සිතියම්	02
ගාල්ල සිතියම්	75	උතුරු පළාත	20
කොළඹ සිතියම්	140	නුවරඑළිය	06
ත්‍රිකුණාමලය සිතියම්	23	වන්නි ප්‍රදේශ	03
බණ්ඩාරවෙල සිතියම්	01	අහලේ සිතියම්	70
මඩකලපුව සිතියම්	03	Section සිතියම්	478
කල්පිටිය සිතියම්	05	දිස්ත්‍රික් හා නගර සිතියම්	80
නැගෙනහිර වෙරළ සිතියම්	03	Resource	01
මැතිවරණ සිතියම්	03	ඉන්දියා සිතියම්	04
බලකොටු සිතියම්	110	ගුවන් ඡායාරූප මඟ පෙන්වීමේ සිතියම්	76
හංවැල්ල සිතියම්	02	විවිධ	40
යාපනය සිතියම්	90	RG 58.5 සිතියම්	23
කළුතර සිතියම්	04	RG 76	107
නුවර සිතියම්	11	RG 52	102
කෝට්ටේ සිතියම්	02	RG 391/184	99
මන්නාරම සිතියම්	02	RG 25.314	02
මාන්තේයි සිතියම්	01	RG 25.341	10
මාතලේ සිතියම්	01	RG 25.357	25

වෙනත්

- සිතියම්වලට අමතරව ඓතිහාසික වැදගත්කමින් යුතු ලේඛන ද අංකිතකරණය

The History of Royal College	237
RG 27/638	163
RBN catalogue(1910-1913)	238

- මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ආබද්ධ වූ සිතියම් 3080ක් ලැයිස්තුගත කිරීම අවසන් කර සිතියම් අංශයේ නව කැබිනට්ටුවල තැන්පත් කිරීම හා එම සිතියම් පරිගණකගත කිරීම

ඓතිහාසික සිතියම්	07	පරිපාලන කොට්ඨාශ සිතියම්	33
කෘෂිකාර්මික සිතියම්	629	ඉඩම් ලියාපදිංචි කොට්ඨාශ සිතියම්	36
අහලේ සිතියම්	128	සාමාන්‍ය සිතියම්	153
1:50,000 සිතියම්	208	ගුවන් සිතියම්	189
මැතිවරණ සිතියම්	87	වනාන්තර දැක්වෙන සිතියම්	66
නගර තක්සේරු සිතියම්	1499	ලෝක සිතියම්	02



i2s Super Scanner යන්ත්‍රය

- ලේඛනාගාරයේ තැන්පත් ගුවන් ඡායාරූප සඳහා හඳුනාගැනීමේ සිතියම් 76 ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට කටයුතු කළ අතර ඒවායේ අංකිතකරණය කරන ලද සිතියම ලේඛනාගාරයේ තැන්පත් කිරීම
- කෝෂ්ඨාගාරයේ තැන්පත්ව තිබූ ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සිතියම් දුවිලි ඉවත් කර සිතියම් අංශයට ගෙන ඒමේ කටයුතු ආරම්භ කිරීම
- මහජන පර්යේෂකයන් සඳහා අංකිතකරණය කරන ලද සිතියම් වලින් පිටපත් නිකුත් කිරීම
- 2017 වර්ෂයේ මිල දී ගත් i2s Super Scanner යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම අත්සන් කිරීම ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් හා සංජය පුද්ගලික ආයතනය විසින් මෙම වර්ෂයේ සිදු කිරීම



සිතියම් එකතුව

7. අධ්‍යාපන, පුහුණු, ප්‍රචාරක අංශය

7.1 අධ්‍යාපන

7.1.1 ප්‍රදර්ශන

අනු අංකය	දිනය	ප්‍රදර්ශනයේ නම හා ස්ථානය
i	2018 මාර්තු 07 හා 08 දින	සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ දී පැවති "විද්‍යා තාක්ෂණික හා අධ්‍යාපන ප්‍රදර්ශනය" සඳහා ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කිරීම
ii	2018 අප්‍රේල් 26 සිට මැයි 02 දක්වා	කුරුණෑගල බිංගිරිය දේවගිරි රජමහා විහාරයේ දී පැවති "හෙළ බොදු කලා අසිරිය" ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කිරීම
iii	2018 අප්‍රේල් 29 සිට මැයි 03 දක්වා	අරලිය ගහ මන්දිරයේ දී පැවති "බුද්ධ රශ්මි ජාතික වෙසක් මංගල්‍යය" ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කිරීම
iv	2018 ඔක්තෝම්බර් 01 හා 02 දින	රුවන්වැල්ල ප්‍රාදේශීය සභා මහජන ක්‍රීඩාංගනයේ දී පැවති "ලෝක ළමා දින රන්වැලි සැමරුම-2018" ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කිරීම
v	2018 නොවැම්බර් 02 දින සිට 04 දක්වා	වලස්මුල්ල ජාතික පාසල් පරිශ්‍රයේ දී පැවති "ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය -2018" ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කිරීම

7.2 පුහුණු

7.2.1 රාජ්‍ය ලේඛන පරිපාලනය හා ලේඛනාරක්ෂක නීතිය පිළිබඳ එක් දින පාඨමාලාව

රාජ්‍ය ආයතනවල විධායක ශ්‍රේණිවල නිලධාරීන් සඳහා පවත්වනු ලබන මෙම පාඨමාලාව මඟින් රාජ්‍ය ලේඛන කළමනාකරණය සහ ලේඛනාරක්ෂක නීතිය පිළිබඳව දැනුමක් ලබා දෙනු ලැබේ. 2018.03.20, 2018.08.28 සහ 2018.09.11 යන දිනයන්හි පාඨමාලා 3ක් පැවැත්විණි. ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය නදීරා රූපසිංහ මහත්මිය, සහකාර අධ්‍යක්ෂ (රා.ඉ.) ආර්.සී.ආර්. ප්‍රියංගනී මහත්මිය, සහකාර ලේඛනාරක්ෂක දිලිනි ලියනගේ මහත්මිය, සහකාර ලේඛනාරක්ෂක හිමාලි වීරකෝන් මහත්මිය, ප්‍රධාන සංරක්ෂණ නිලධාරි (අධිලේඛන) (රා.ඉ.) කේ.එච්. අශෝකා මිය සහ අධිලේඛන සංරක්ෂණ අධීක්ෂණ නිලධාරි නිහාල් පින්දෙනිය මයා ඒ සඳහා දේශන පැවැත්වූහ. මෙම පාඨමාලා සඳහා නිලධාරීන් 204 දෙනෙක් සහභාගී විය.

7.2.2 ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ පස්දින පාඨමාලාව

ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ පස්දින පාඨමාලාව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා වෙනත් රජයේ ආයතනවල කළමනාකරණ

සහකාර සේවයේ හා ඊට ඉහළ විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන් සඳහා පැවැත්වේ. 2018 වර්ෂය තුළ දී ලේඛන කළමනාකරණය පිළිබඳ පස්දින පාඨමාලාවන් 4ක් පවත්වන ලදී. ඒ අනුව, 2018.03.05 සිට 2018.03.09 දක්වාත් 2018.05.14 සිට 2018.05.18 දක්වාත් 2018.08.13 සිට 2018.08.17 දක්වාත් 2018.10.15 සිට 2018.10.19 දක්වාත් පාඨමාලා පවත්වා ඇත. ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් නදීරා රූපසිංහ මහත්මිය, සහකාර අධ්‍යක්ෂ (රා.ඉ) ආර්.සී.ආර්. ප්‍රියංගනී මහත්මිය, සහකාර ලේඛනාරක්ෂක දිලිනි ලියනගේ මහත්මිය, සහකාර ලේඛනාරක්ෂක හිමාලි වීරකෝන් මහත්මිය, විශ්‍රාම ගිය සහකාර ලේඛනාරක්ෂක ජෝෂප් පැට්‍රික් පීරිස් මහතා, සහකාර ලේඛනාරක්ෂක සුමනා අමරසිංහ මහත්මිය, සහකාර ලේඛනාරක්ෂක සුනීතා ගුරුගේ මහත්මිය, සහකාර ලේඛනාරක්ෂක ශිරාණි පටබැඳි මහත්මිය, සහකාර ලේඛනාරක්ෂක සෞම්‍යා සෙනරත් මහත්මිය, ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන) (රා.ඉ) කේ.එච්. අශෝකා මහත්මිය යන නිලධාරීහු ලේඛන කළමනාකරණය හා සංරක්ෂණය පිළිබඳ දේශන පැවැත්වූ අතර, ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන) (රා.ඉ) කේ.එච්. අශෝකා මහත්මිය, සහකාර ලේඛන ප්‍රතිරූපණ ශිල්පී ධනූ එගොඩවත්ත මහතා, ශ්‍රව්‍ය - දෘෂ්‍ය කාර්මික ඩී. ඩී ජයන්ත මහතා යන නිලධාරීහු ප්‍රායෝගික අභ්‍යාස මඟින් දැනුවත් කිරීම් පවැත්වූහ. 2018 වර්ෂයේ දී මෙම පාඨමාලා සඳහා රාජ්‍ය නිලධාරීන් 285 දෙනෙක් සහභාගී වූහ.

7.2.3 පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු පාඨමාලාව

2018 වර්ෂය තුළ දී අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි රජයේ සහ අර්ධ රාජ්‍ය ආයතනවල කාර්යාල සේවක සේවයේ මහත්ම මහත්මීන් සඳහා පොත් බැඳීම පිළිබඳව දින 30ක පාඨමාලා 5ක් පැවැත්වීය. දේශීය හා විදේශීය පුහුණුව ලැබූ ශිල්පීය අංශයේ නිලධාරීන් විසින් පුහුණු කිරීමේ කටයුතු සිදු කරනු ලැබූ අතර මෙම පාඨමාලාව සඳහා නිලධාරීන් 85 දෙනෙක් සහභාගී වූහ.



පොත් බැඳුම්කරණය පාඨමාලාව

7.2.4 පළාත් පාලන ලේඛන කළමනාකරණ වැඩමුළුව



සම්මන්ත්‍රණය හා සමාරම්භක උළෙල

"පළාත් පාලන ලේඛන කළමනාකරණය" යන තේමාව යටතේ මෙවර සම්මන්ත්‍රණය හා සමාරම්භක උළෙල දෙපාර්තමේන්තුවේ දී සැප්තැම්බර් මස 06 හා 07 යන දිනයන්හී දී පළාත් පාලන ආයතනවල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී. මෙම වැඩමුළුවේ සම්පත්දායකයන් ලෙස එක්සත් රාජධානියේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් ලේඛනාගාරයේ ලෝරා ටේල (Laura Taylor) සහ නෙදර්ලන්තයේ රොටර්ඩෑම් නගර සභාවේ ආචාර්ය බාර්ට් බලෝ (Bart Ballaux) සහභාගි වූ අතර මේ සඳහා අන්තර්ජාතික ලේඛනාරක්ෂක කෞන්සිලයේ සහාය ශ්‍රී ලංකා ජාතික ලේඛනාගාරය වෙත ලැබුණි.

එහි දී පවත්වන ලද දේශන-

- Observations on records management in Municipal Councils and Urban Councils in Sri Lanka – Ms. Chamila Rajapathirana, Assistant Director (AtD)
- Management of traditional historical archives – Ms. Laura Taylor
- Implementing an electronic work (and records management) environment: how to make it work – Dr. Bart Ballaux
- Metadata, classification and appraisal in an electronic environment - Dr. Bart Ballaux
- Paper Records Management at London Metropolitan Archives & crating reyention schedules - Ms. Laura Taylor
- Records disposal, sensitive records, personal information - Ms. Laura Taylor
- Steps in creating a retention schedule - Dr. Bart Ballaux

දහනව වන සියවසේ දී බ්‍රිතාන්‍යයන් විසින් 1865 අංක 17 දරන ආඥා පනත අනුව වඩාත් කාර්යක්ෂම පරිපාලන ක්‍රමයක් ඇති කර ඵලදායී මහජන සේවාවක් සැපයීම අරමුණු කර ගනිමින් කොළඹ, මහනුවර හා ගාල්ල යන නගරවල මහ නගර සභා ආරම්භ කරන ලදී. මෙමඟින් මාර්ග සැකසීම සහ නඩත්තු කිරීම, වීථි ආලෝකකරණය, ජලය සැපයීම, මහජන සෞඛ්‍ය සේවා, සනීපාරක්ෂක ක්‍රමවේද සහ වෙළඳ පහසුකම් සපයන අතර, මෙම නගර සභාවලට අයත් ලේඛන ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත්ව පවතී.

පළාත් පාලන ආයතනවල සාම්ප්‍රදායික ලේඛන මෙන්ම විද්‍යුත් සහ ඩිජිටල් ලේඛන කළමනාකරණය කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම මහඟු අවස්ථාවක් වන අතර, පළාත් පාලන ලේඛන කළමනාකරණය පිළිබඳව විශේෂඥ දැනුමක් ඇති විදේශීය විද්වතුන් දෙදෙනෙකුගේ සහභාගිත්වය මෙම වැඩසටහන සඳහා විශාල රුකලක් විය. ලේඛන කළමනාකරණය විෂය පථයට අදාළව ලේඛන ඇගයීම, අනවශ්‍ය ලේඛන විනාශ කිරීම, අදාළ නීති සහ රෙගුලාසි අනුව ස්ථිර සංරක්ෂණය සඳහා ලේඛන ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ආබද්ධ කර ගැනීම, මහජනයාට පළාත් පාලන ආයතනවල ලේඛනවලට ප්‍රවිෂ්ඨ වීමේ ක්‍රියා පිළිවෙත, ආදී මාතෘකා පිළිබඳව සාකච්ඡා කරන ලදී. 2016 වර්ෂයේ දී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහය ඇතිව මහ නගර සභා සහ නගර සභාවල ලේඛන කළමනාකරණය සහ ලේඛන කාමර පිළිබඳ ප්‍රශ්නාවලියක් මඟින් ලබාගත් දත්ත මෙහි දී පාදක කරගනු ලැබේ.



සම්මන්ත්‍රණය හා සමාරම්භක උළෙල

මෙම සම්මන්ත්‍රණය ලේඛනාරක්ෂකවරු මෙන්ම රටේ පළාත් පාලන ආයතනවල නිලධාරීන් මුහුණ දෙන අභියෝග හා ගැටලු විසඳීමේ අනාගත ප්‍රයත්නයන් සඳහා විශිෂ්ට ආරම්භයක් විය. දෙදින සම්මන්ත්‍රණයට පළාත් පාලන ලේඛන කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර විශේෂඥයින් දෙදෙනෙකුගේ දායකත්වය අතිශයින්ම ප්‍රයෝජනවත් විය. ලේඛන ඇගයීම, ලේඛන අපහරණය කිරීම, ඇතැම් නීතිරීති හා රෙගුලාසි යටතේ ස්ථිර සංරක්ෂණය සඳහා වටිනා ලේඛන ආබද්ධ කර

ගැනීම සහ අපහරණ උපලේඛන සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ශ්‍රී ලංකාවේ සහභාගිවන්නන් සමඟ ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් බෙදාහදා ගැනීමට ඔවුන්ට හැකි විය. පළාත් පාලන ලේඛන කළමනාකරණය කිරීමේ ගැටලු සහ අභියෝග පිළිබඳව සහභාගිවන්නන් අතර සාකච්ඡා කිරීමේ වේදිකාවක් එය විවෘත කළේය. සාම්ප්‍රදායික හා ඩිජිටල් ලේඛන නිර්මාණය කිරීමේ දී සිට අපහරණය කිරීම දක්වා අවශ්‍ය මූලික දැනුම සහ කුසලතා උපයා ගැනීමට සහභාගිවන්නන්ට හැකි විය.

7.3 ප්‍රචාරණය

දෙපාර්තමේන්තුවේ තැන්පත් ලේඛන පිළිබඳව හා දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන සේවාවන් පිළිබඳව පාසල් ශිෂ්‍යයන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා මහජනතාව දැනුවත් කිරීම මෙම අංශය මඟින් සිදුකෙරේ. පුවත්පත් වලට ලිපි සැපයීම, රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ජාතික ලේඛනාගාරයේ කාර්යයන් පිළිබඳව ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් නිපදවීම ද මෙමඟින් සිදුවේ.

අන්තර්ජාතික ලේඛනාරක්ෂක කෞන්සිලය විසින් 1978 වර්ෂයේ දී ගත් තීරණයක් අනුව එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික ආයතනයේ (UNESCO) සාමාජිකත්වය දරන රටවල ජාතික ලේඛනාගාරයන් විසින් ජාතික ලේඛනාරක්ෂක සතියක් පැවැත්විය යුතුයැයි ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේ පළමු ජාතික ලේඛනාරක්ෂක සතිය 1979 වර්ෂයේ පැවැත්වූ අතර එතැන් පටන් ශ්‍රී ලංකා ජාතික ලේඛනාගාරය "ජාතික ලේඛනාරක්ෂක සතිය" සෑම වර්ෂයකම නොවැම්බර් මාසයේ මුල් සතියේ හෝ ඊට ආසන්න සතියක පවත්වන ලදී.

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ දිරාගිය කොන්ක්‍රීට් ෆින්ස් හේතුවෙන් 2017 වර්ෂයේ සැප්තැම්බර් සිට ප්‍රධාන දොරටුව වසා දැමීමට සිදු වූ අතර 2018 වර්ෂයේ අප්‍රේල් මාසයේ දී කොන්ක්‍රීට් ෆින්ස් කීපයක් හදිසියේ පහළට කඩා වැටිණි. එහි ඇති අනතුරුදායක බව හේතුවෙන් දිරාගිය කොන්ක්‍රීට් ෆින්ස් ගලවා ඉවත් කර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු සිදු කළ අතර ලේඛනාරක්ෂක සතියක් පැවැත්වීම වෙනුවට දින දෙකක දී ඉහත සඳහන් පළාත් පාලන ලේඛන කළමනාකරණය සම්බන්ධ සම්මන්ත්‍රණය හා සමාරම්භක උළෙල පැවැත්වීමට තීරණය විය.

8. විශේෂ ව්‍යාපෘති

8.1 සුවිපත් පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් ලේඛන සඳහා සකස් කර ඇති සුවිපත් පරිගණකගත කිරීම සඳහා 2016 ජුනි මස 06 වන දින ආරම්භ කරන ලද ව්‍යාපෘතියේ 2018 වර්ෂය අවසානය වන විට පරිගණක ගතකර ඇති සුවිපත් ප්‍රමාණය 396,777කි. මෙම සුවිපත් පරිගණකගත කිරීම දත්ත ඇතුළත් කිරීමේ නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ. දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙක් විසින් මෙම දත්ත පරීක්ෂා කර නිවැරදි කිරීම් සළකුණු කර ලබා දීමෙන් අනතුරුව දත්ත ඇතුළත් කිරීමේ නිලධාරීන් විසින් ඒවා නැවත නිවැරදි කරනු ලැබේ. ඉන් අනතුරුව උපදේශකවරයකු මඟින් අවසන් පරීක්ෂා කිරීම් සිදු කරනු ලැබේ.

ව්‍යාපෘතිය සඳහා උපදේශක ලෙස විශ්‍රාමලත් ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ආචාර්ය කේ.ඩී.ජී විමලරත්න මහතාගේ අසනීප තත්ත්වය හේතුවෙන් සහ 2018 වර්ෂයේ අභවප්‍රාප්ත වීමත් සමඟ ඔහුගේ උපදේශක සේවාවන් සඳහා මෙම වර්ෂයේ දී අහිමි විය. විශ්‍රාමලත් ජාතික ලේඛනාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ මහාචාර්ය කේ. ඩී. පරණවිතාන මහතා තවදුරටත් උපදේශක සේවාවන් ලබා දුනි. සුවිපත් පරික්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික මාණ්ඩලික නිලධාරීන් වන සී. ජේ. මහරගේ මහත්මිය සහ වසන්ති එගොඩවත්ත මහත්මිය කටයුතු කරනු ලබන අතර ව්‍යාපෘතිය තවදුරටත් සිදු කරමින් පවතී.

9. පරිගණක අංශය

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පරිගණක අංශය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය, වෛරස් මෘදුකාංග යාවත්කාලීන කිරීම, පරිගණක ජාලය නඩත්තු කිරීම සහ දෙපාර්තමේන්තුවේ දෛනික පරිගණක ආශ්‍රිත ගැටලු නිරාකරණය කිරීම සිදු කරනු ලබයි. එමෙන්ම Times ව්‍යාපෘතිය මඟින් ගබඩා කර ඇති දත්ත යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සඳහා අඛණ්ඩ පරිගණක සහය ලබා දෙමින් අවශ්‍ය අවස්ථාවලදී එම දත්ත නැවත ලබා දීම ද සිදු කරනු ලබයි. පරිගණක උපාංග මිල දී ගැනීමේ කමිටුවේ කටයුතු කිරීම ද 2018 වර්ෂය තුළ පරිගණක අංශය මඟින් සිදු කරන ලද කාර්යයන්ට ඇතුළත් වේ.

10. ඡායාරූප සහ සූක්ෂම ඡායාරූප අංශය

මෙම අංශය මඟින් දෙපාර්තමේන්තුවේ තැන්පත්ව ඇති භෞතිකව දුර්වල තත්ත්වයේ ඇති ලේඛන සහ අනෙකුත් අත්‍යවශ්‍ය ලේඛන සූක්ෂම චිත්‍රපටවලට ගැනීම සිදු කෙරේ. මීට අමතරව දෙපාර්තමේන්තුවේ විවිධ අවස්ථාවන්හි දී ඡායාරූප කටයුතු ඉටු කිරීම ද මෙම අංශයෙන් සිදු කෙරේ. තව ද, මහජන අවශ්‍යතා වෙනුවෙන් ඩිජිටල් කැමරා උපයෝගී කර ගනිමින් විවිධ ලේඛන වල උද්ධෘත ලබා දීම ද මෙම අංශයෙන් සිදු කෙරේ. මෙම අංශයෙන් කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

පුවත්පතේ නම	කාලය	අනාවරණ
සිලෝන් ඩේලි නිව්ස් (පැරණි)	1949.10.01 - 1952.12.31	58,200
ඩේලි නිව්ස් (නව)	2017.10.01 - 2018.09.30	
මහජන ඉල්ලීම් සඳහා ඩිජිටල් කැමරාවෙන් උද්ධෘත නිකුත් කිරීම.		15,790

11. ශ්‍රව්‍ය දෘශ්‍ය අංශය

ලේඛනාගාරයට ආබද්ධ වූ චුම්භක ටේප්පට, වීඩියෝ කැසට්පට, වල චිත්‍රපට, ශ්‍රව්‍ය කැසට්පට අංකනය කිරීම, පරීක්ෂා කිරීම, පිරිසිදු කිරීම සහ සූක්ෂම චිත්‍රපටි ආදිය අංක කර පිළිවෙළට තැන්පත් කිරීම, පරීක්ෂා කිරීම, මහජන සහ පර්යේෂණ අවශ්‍යතා සඳහා පර්යේෂණ කාමරයට නිකුත් කිරීම සහ පර්යේෂණ අවශ්‍යතා අනුව ඒවායේ පිටපත් නිකුත් කිරීම වැනි කාර්යයන් ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය මඟින් ඉටුකරනු ලබයි. එසේ ඉටු කරනු ලැබූ කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.



ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය

11.1 ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන සංරක්ෂණය

i. පහත සඳහන් චුම්භක ටේප්පට වාරිකව එක් වතාවක් පරීක්ෂා කිරීම, පිරිසිදු කිරීම හා නැවත එතීම

- 25.86/S.M.T/01, 03-169 දක්වා
- 73/S.M.T/01-59, 61 සිට 83, 93, 94, 101 සිට 123, 139-155, 157-162, 164, 165, 167-193
- 25.147/S.M.T/01-16
- 25.286/S.M.T/257-265
- 108 3/S.M.T/24, 25, 26, 27

ii. ජනාධිපති කොමිෂන් සභා Lot No - 405, 433, 405, 454, 456, 457, 460, 77 (ඕඩියෝ කැසට්පට) A.C නැවත එතීම සහ පරීක්ෂා කිරීම සහ Lot No - 580, 623, 640, 641, 384, 335, 658, (ඕඩියෝ කැසට් පට) A.C නැවත එතීම සහ පරීක්ෂා කිරීම/ විස්තර සටහන් කර තැබීම.

iii. චිත්‍රපට සංස්ථාවෙන් පැමිණෙන නිලධරයන් ලවා Positive චිත්‍රපට 160 ක් ද Negative (Picture & Sound) චිත්‍රපට 42ක් ද නැවත එතවීම.

iv. චිත්‍රපට අධිලේඛනාගාරයේ තැන්පත් කර ඇති සියලුම චිත්‍රපට පිටපත් පිළිවෙලකට අංක සහ නම් ඇතුළත් කර රාක්ක මත තැන්පත් කිරීම.

v. වීඩියෝ කැසට්පට (VHS) 50ක් පරීක්ෂා කිරීම, පිරිසිදු කිරීම හා නැවත එතීම.

vi. සුක්ෂම චිත්‍රපට 3000ක් පරීක්ෂා කිරීම හා නැවත එතීම.

vii. ශ්‍රව්‍ය දෘශ්‍ය කැසට්පට පරීක්ෂා කිරීම, පිරිසිදු කිරීම හා නැවත එතීම.

11.2 ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන ආබද්ධ කිරීම

i. ලේඛන ආබද්ධ කිරීමේ අංශයෙන් ලැබෙන තැටි භාර ගැනීම. (CD – 72, DVD – 15, Blu ray – 190, Pen Drive – 02)

ii. ජාතික චිත්‍රපට සංස්ථාවෙන් නයිට්‍රේට් චිත්‍රපටයක් ආබද්ධ කරගෙන ඇත. (News Reel)

iii. පෞද්ගලික ආබද්ධ කිරීම් ලෙස D.B. නිහාල්සිංහ මහතාගේ වැලිකතර චිත්‍රපටය ආබද්ධ කර ගෙන ඇත.

11.3 ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන මහජන පරිශීලනයට ලබා දීම

i. සුක්ෂම චිත්‍රපට 777ක් සෙවීම් කාමරයට නිකුත් කිරීම හා සුක්ෂම චිත්‍රපට 780ක් සෙවීම් කාමරයෙන් ආපසු භාරගෙන නිසි පරිදි තැන්පත් කිරීම.

ii. සුක්ෂම චිත්‍රපට වැඩ ඒකක 13ක් පරිගණක ප්‍රතිමූර්ති පිටපත් වැඩ ඒකක 75ක් CD පිටපත් ද නිමකර මහජන සම්බන්ධතා අංශයට භාර දීම.

iii. පර්යේෂණ සඳහා ජන සංගීතය ඇසීමට පැමිණි පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් සහ විද්වතුන් හට ජන ගී ශ්‍රවණය කිරීමට සහ පිටපත් කර දීමට සැලැස්වීම

iv. ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන පරිශීලනය සඳහා පර්යේෂකයන් 168 දෙනෙක් පැමිණි අතර නිකුත් කර ඇති ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛන (reel) සංඛ්‍යාව 777ක් වේ.

11.4 චිත්‍රපට අංකිතකරණය

චිත්‍රපට අධිලේඛනාගාරයේ අංකිතකරණ කටයුතු 2017 ජූලි මාසයේ ආරම්භ කළ අතර 2018 දෙසැම්බර් මාසය අවසන් වන විට චිත්‍රපට 237ක් අංකිතකරණය කරන ලදී. මෙම අංකිතකරණය කළ චිත්‍රපට blu-ray තැටිගත කර චිත්‍රපට අධිලේඛනාගාරයේ තැන්පත් කර ඇත. චිත්‍රපට අංකිතකරණය කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති චිත්‍රපට 237 න් 104 ක් 2017 වසරේ පරීක්ෂාවට ලක් කර ඇති අතර ඉතිරි චිත්‍රපට 133 ක් 2018 දී පරීක්ෂාවට ලක් කරන ලදී.

මෙහි දී චිත්‍රපටයට යොදා ඇති ලේඛනාගාර අංකය, චිත්‍රපටයේ ආරම්භය, එහි අවසානය, ශබ්දය, චිත්‍රපටය නොකඩවා ගලා යන්නේද ආදි කරුණු පරීක්ෂාවට ලක් කරනු ලබයි. Blu-ray කළ චිත්‍රපට 237 සඳහා දත්තානුදත්ත (metadata) තොරතුරු සුචියක් සාදා ඇත. මෙම සුචියේ චිත්‍රපටයේ ලේඛනාගාර අංකය, කාලය, නළුනිළි පිරිස, නිෂ්පාදනය, අධ්‍යක්ෂණය ආදි තොරතුරු ඇතුළත්ය. චිත්‍රපට අධිලේඛනාගාරය සතු චිත්‍රපට 378 සඳහා සුචියක් සකස් කරන ලදී.



චිත්‍රපට අධිලේඛනාගාරය

11.5 වෙනත්

i. ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශයේ තිබෙන සියලුම උපකරණවල නඩත්තු සහ සේවා කටයුතු ඉටුකරවා ගැනීම

ii. පස්දින පාඨමාලාව හා පොත් බැඳීමේ පාඨමාලාව හදාරන අයට ශ්‍රව්‍ය - දෘෂ්‍ය අංශය පිළිබඳව දැනුවත් කිරීම

iii. විශ්ව විද්‍යාල සිසුන් සඳහා දින 2ක් ශ්‍රව්‍ය දෘෂ්‍ය අංශය පිළිබඳව දැනුවත් කිරීම

iv. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ සහ සම්මන්ත්‍රණ ශාලාවේ රාජකාරි කටයුතු කිරීම

12. ශිල්පීය අංශය

12.1 ලේඛන ප්‍රතිසංස්කරණය හා සංරක්ෂණය

ලේඛනාගාරයේ තැන්පත් අධිලේඛන සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනු ලබන්නේ මෙම අංශයෙන් වන අතර අධිලේඛන සංරක්ෂකවරුන් ප්‍රමාණය ඉතා අවම එනම් 06ක් වීම හේතුවෙන් මෙම වසරේ දී කරනු ලැබූ කාර්යයන් සීමා වී ඇත.

සංරක්ෂණ කාර්යය	**සංරක්ෂණය කළ පිටු ගණන**
නිරාමිලීකරණය	3409
සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කළ	3409
අර්ධ වශයෙන් ප්‍රතිසංස්කරණය කළ	--
ප්‍රථමාධාර	--
කැපීම්	20150
ආරක්ෂක තීරු යෙදීම	288
අහලට නැමීම	98
කොටස් මැසීම	19800
සීස් කිරීම	3800
අග මුල කොළ සෑදීම	1256
පොත් බැඳීම	2018
සම්පූර්ණ ප්‍රතිසංස්කරණය කරන ලද වෙළුම්	11
අර්ධ ප්‍රතිසංස්කරණය කරන ලද වෙළුම්	--
රන් ආලේපිත පොත්	636
ගැසට් බැඳීම්	152
ගැසට් ප්‍රතිසංස්කරණය කිරීම	04
ස්ථාවර බැඳීම්	1500
සරඹේරු කවර සෑදීම	84
පුවත්පත් බැඳීම	320
පුස්තකාල පොත් බැඳීම	30
පුස්තකාල පොත් ප්‍රතිසංස්කරණය කිරීම	03
පෙට්ටි	125
සුචිපත්‍ර	5000

සංරක්ෂණ කාර්යය	සංරක්ෂණය කළ පිටු ගණන
Folders	06
තයිමෝල් ධූමායනය	18
ෆොස්ෆීන් ධූමායනය	--
ලිපිගොනු කවර	84
ඩම් කවර	84
Dockets	07
Flags	13000
ලෙජර්	85
සිතියම්	03
පුස්කොළ පත්ඉරු සංරක්ෂණය	69860
පුස්කොල පොත් නූල් දැමීම	1922
පන්සල් රාජකාරි	10
පොත් බැඳුම්කරුවන් පුහුණු කිරීම	84
වෙනත් විවිධ රාජකාරි (පූජ්‍ය ස්ථානවල මුද්‍රිත පොත් සංරක්ෂණය)	14565

12.2 ශිල්පීය සහාය ලබා දුන් ආයතන

මෙම අංශය මඟින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ආදී රාජ්‍ය ආයතන හා රාජ්‍ය අනුබද්ධ ආයතනවලට මෙන්ම පෞද්ගලික ආයතන සඳහා ද ලේඛන ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම පිළිබඳ උපදෙස් ලබා දෙන අතර පූජ්‍ය ආයතනවල ලේඛන සංරක්ෂණය කිරීම ද සිදුවේ. ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව ලේඛන කාමරයක් සකස්කර ගැනීම, යම් ආයතනයක ලේඛන විනාශ වීම වැලැක්වීම මෙන්ම ලේඛන කාමරයක් පවත්වාගෙන යාම සඳහා වන උපදෙස් දීම ආදී කාර්යයන් ද මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර, මෙම වර්ෂය තුළ දී ශිල්පීය සහාය ලබා දුන් ආයතන පහත පරිදි වේ.

අනු අංකය	ආයතන	ප්‍රමාණය
i.	දෙපාර්තමේන්තු	12
ii.	හමුදා	04
iii.	නගර සභා / ප්‍රාදේශීය ලේකම් කාර්යාල	08
iv.	ව්‍යවස්ථාපිත ආයතන	11
v.	පුද්ගලික ආයතන	06

12.3 පූජ්‍ය ස්ථානවල ලේඛන සංරක්ෂණය

ලංකාවේ ඉපැරණි විහාරස්ථානවල තැන්පත්ව ඇති පුස්කොළ පොත් හා අත්ලිපි සංරක්ෂණය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව ඉටු කරනු ලබන කාර්යයකි. මෙම වර්ෂය තුළ දී පූජ්‍ය ස්ථාන 10ක සංරක්ෂණ කටයුතු සිදු කරන ලද අතර පත් ඉරු 69,860 ක් සංරක්ෂණය කර ඇත.



ශිල්පීය අංශය



අධිලේඛන සංරක්ෂණය

13. පර්යේෂණ කාමරය

කොළඹ 07, පිලිප් ගුණවර්ධන මාවතේ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් ද මහනුවර පැරණි උසාවි සංකීර්ණයට යාබදව පිහිටා ඇති ශාඛා කාර්යාලයෙන් ද පර්යේෂණ සඳහා අවශ්‍ය පහසුකම් සලසා තිබේ. ඒ අනුව මෙම වර්ෂය තුළ දී ප්‍රධාන ශාඛාවට පර්යේෂණ කටයුතු සඳහා පර්යේෂකයන් පැමිණි වාර ගණන 3163 ක් වන අතර ඔවුන් සඳහා අධිලේඛන 1410ක්, පුවත්පත් 1547ක්, ග්‍රන්ථ 756ක්, සිතියම් 71ක්, සූක්ෂම චිත්‍රපට 777ක්, ඡායාරූප හා පුවත්පත් කැපුම් පැකට් 39ක් නිකුත් කර ඇත.

මීට අමතරව ලේඛන කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් සහ පොත් බැඳීම පිළිබඳ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වන නිලධාරීන් වෙනුවෙන් පර්යේෂණ කාමරය පිළිබඳ දැනුවත් කිරීමේ දේශන පවත්වන ලදී.

පර්යේෂණ කාමරයේ කටයුතු වඩාත් විධිමත් කිරීම සඳහා පර්යේෂණ කාමරය භාවිතා කිරීමේ නීති රීති උපදෙස් මාලාවක් නිකුත් කළ අතර ලේඛන නිකුත් කිරීමේ පත්‍රය ක්‍රමවත්ව සකස් කරන ලදි. ඊට අමතරව ලේඛනවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ආරක්ෂක අංශයේ නිලධාරියෙකු පර්යේෂණ කාමරය ඉදිරිපස ස්ථානගත කිරීම සහ පාඨක අවසර පත් ලබා දීමේ දී වලංගු හැඳුනුම්පතක පිටපත් ලබා ගැනීම වැනි ක්‍රියාවලි ආරම්භ කරන ලදි.

තව ද, අංකිතකරණය කරන ලද ටයිම්ස් ඡායාරූප සහ පුවත්පත් කැපුම් එකතුව සඳහා ප්‍රවේශ වීමේ පහසුකම් පර්යේෂණ කාමර්යේ දී ලබා දීම ආරම්භ කරන ලදි.

14. මහජන සම්බන්ධතා අංශය

දෙපාර්තමේන්තුව සහ මහජනතාව අතර ව්‍යක්තීය සේවා සම්බන්ධතාවය පවත්වාගෙන යනු ලබන්නේ මෙම අංශය මඟිනි. මහජන අවශ්‍යතා අනුව සෙවීම් කටයුතු භාර ගැනීම හා ඒවායේ උද්ධෘත නිකුත් කිරීම, උද්ධෘත පිටපත් සහතික කිරීම, උසාවි කටයුතු සම්බන්ධීකරණය කිරීම, පර්යේෂකයන් පර්යේෂණ කාමරය සඳහා යොමු කිරීම, පර්යේෂණ අවශ්‍යතා අනුව ලේඛනවල උද්ධෘත නිකුත් කිරීම, ආදී වූ කාර්යයන් සිදු කරනු ලබන්නේ මෙම අංශය මඟිනි.

අනු අංකය	ඉල්ලුම්පත් වර්ගය	ලැබුණු අයදුම්පත් ගණන	නිකුත් කළ සංඛ්‍යාව
i	රජයේ සන්නස් හා දීමනා පත්‍ර	559	581
ii	ධාන්‍ය බදු	143	114
iii	නිල පංගු, ප්‍රවේනි පංගු සහ කොමසාරිස් සටහන්	107	78
iv	විහාර හා දේවාල ඉඩම්	56	50
v	තෝම්බු	56	48
vi	ඡන්ද නාමලේඛන	745	705
vii	රජයේ ගැසට්	1171	1165
viii	ලේඛන පිටපත් සහතික කිරීම	225	225
ix	දේශීය විමසීම් (විවිධ)	81	51
x	විදේශීය විමසීම් (විවිධ)	06	03
xi	පරිගණක ප්‍රතිමූර්තිකරණය	678	606

14.1 ලේඛනවල සහතික පිටපත් නිකුත් කිරීම

මහජනතාවගේ සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල අවශ්‍යතාවයන් සඳහා අධිලේඛනවලින් සහතික පිටපත් නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ. මහජන ඉල්ලීම් අනුව ලන්දේසි තෝම්බුවල පරිවර්තන, ඡන්ද නාමලේඛන, ගැසට් පත්‍ර, පුවත්පත්, රජයේ දීමනා පත්‍ර, රජු විසින් නිකුත් කරනු ලැබූ සන්නස්, ධාන්‍ය බදු ලේඛන ආදියෙහි සහතික පිටපත් නිකුත් කරන අතර, එයට අමතරව ප්‍රකාශන හා මාධ්‍ය කටයුතු සම්බන්ධයෙන් ද විවිධ සහතික පිටපත් නිකුත් කරනු ලැබේ.

14.2 උසාවි කටයුතු

දිවයින පුරා පිහිටි දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ වලින් ලැබෙන සිතාසිවලට අනුව, ලේඛනවල පිටපත් සහ මුල් පිටපත් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීම සහ වාචික සාක්ෂි දීම මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඉටු කරනු ලැබේ.

14.2.1 උසාවි කටයුතු සඳහා උද්ධෘත නිකුත් කිරීම

විෂයය	වාර ගණන
ඡන්ද නාමලේඛන	37
ගැසට්	01
ධාන්‍ය බදු ලේඛන	01
හේන් ලැයිස්තු	01
පුවත්පත්	04
සන්නස්	03
නිල පංගු	01
විහාර හා දේවාල ඉඩම්	02

14.3 ප්‍රතිමූර්තිකරණ කාමරය

මහජන ඉල්ලීම්, පර්යේෂණ කටයුතු සහ රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයන් සඳහා අධිලේඛන වලින් උද්ධෘත නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ. දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ප්‍රදර්ශන සඳහා අවශ්‍ය වූ පුවත්පත් උද්ධෘත හා අනෙකුත් ප්‍රතිමූර්තිකරණ අවශ්‍යතා ද ඉටු කර දීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.



පර්යේෂණ අංශය



මහජන සම්බන්ධතා අංශය

15. පුස්තකාලය

විවිධ විෂයන්ගෙන් සමන්විත ඉතා වටිනා පොත් ඇතුළත් පුස්තකාලයක් ජාතික ලේඛනාගාරය සතුව ඇත. ඉතිහාසය, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, ජනශ්‍රැති, මානව විද්‍යාව, නීතිය, විදේශ සම්බන්ධතා, සාහිත්‍ය, අධිලේඛන විද්‍යාව වැනි විෂයන් සම්බන්ධ පොත් මෙහි තැන්පත්ව ඇත.

පුස්තකාලය මහජනයාට විවෘත නොවුව ද එම එකතුවේ පොත් ද්විතීයික මූලාශ්‍රයක් ලෙස අධිලේඛන පරිශීලනය කරන අතරතුර පරිශීලනය සඳහා අවශ්‍ය වූ විට පුස්තකාලයෙන් පර්යේෂණ කාමරය වෙත ගෙන්වා ගත හැකිය. මෙම වර්ෂය තුළ දී රුපියල් 59,774.00 ක මුදලකට පොත් 95ක් මිල දී ගත් අතර, ත්‍යාග වශයෙන් පොත් 15ක් ලැබිණි. එසේම සඟරා 64ක් ප්‍රතිග්‍රහණය කර ඇත.

මිල දී ගන්නා ලද සහ ත්‍යාග වශයෙන් ලැබුණු පොත්

විෂයය	මිල දී ගත් සංඛ්‍යාව	ත්‍යාග වශයෙන් ලැබුණු සංඛ්‍යාව
සිංහල	35	03
දේශපාලනය	09	01
සමාජ විද්‍යාව	11	--
පරිපාලනය	04	--
ආගමික	14	05
චරිතාපදාන	22	06
එකතුව	**95**	**15**

16. පොත් හා ප්‍රවෘත්ති පත්‍ර ලියාපදිංචි කිරීමේ අංශය

මුද්‍රණාල ලියාපදිංචි කිරීම, ලියාපදිංචි වූ මුද්‍රණාලවල මුද්‍රණය කරනු ලබන ප්‍රකාශන, වාර සඟරා, ප්‍රවෘත්ති පත්‍ර ලියාපදිංචි කිරීම හා ඊට අදාළ සටහන් යාවත්කාලීන කිරීම මෙන්ම පොත්සැල් පරීක්ෂාව, මුද්‍රණාල පරීක්ෂා කිරීම, මාසික ප්‍රකාශ පත්‍ර නොඑවන මුද්‍රණාලවලට එරෙහිව නඩු පැවරීම ආදී කටයුතු මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ.

16.1 මුද්‍රණාල ලියාපදිංචිය

මුද්‍රණාල පිළිබඳ ආඥා පනතේ (178 අධිකාරියෙහි) දෙවන ඡේදයට අනුව 2018 වර්ෂයට නව මුද්‍රණාල ලියාපදිංචි කිරීම සඳහා ලැබී ඇති දිවුරුම් ප්‍රකාශ සංඛ්‍යාව 55කි. 2018 වර්ෂය තුළ වසා දමන ලද මුද්‍රණාල සංඛ්‍යාව 76කි. 2017.12.31 දිනට පැවති මුද්‍රණාල සංඛ්‍යාව 2536කි. 2018.12.31 දින වන විට දිවයිනේ දිස්ත්‍රික්ක අනුව දිවයින පුරා ලියාපදිංචි මුද්‍රණාල සංඛ්‍යාව 2515කි. කොළඹ මහ නගර සභා සීමාව තුළ මුද්‍රණාල 415ක් පිහිටා ඇති අතර මහ නගර සභා සීමාවෙන් පිටත කොළඹ දිස්ත්‍රික්කය තුළ මුද්‍රණාල 626ක් ද, අනෙකුත් දිස්ත්‍රික්ක තුළ ලියාපදිංචි වූ මුද්‍රණාල 1474ක් ද වේ.

16.2 මුද්‍රණාල පරීක්ෂා කිරීම

මුද්‍රණාල ආඥා පනත, මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥා පනත හා ප්‍රවෘත්ති පත්‍ර ආඥා පනත නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීහු

කොළඹ, කළුතර, කෑගල්ල, ගාල්ල, හම්බන්තොට, ගම්පහ, මාතර, නුවර, රත්නපුර යන දිස්ත්‍රික්කවල මුද්‍රණාල පරීක්ෂා කළහ. මෙම පරීක්ෂණ සඳහා මූලික තොරතුරු සපයා ගැනීමට පොලිස් දෙපාර්තමේන්තුවෙන් ලද සහාය ඉතා අගය කරමි.

16.3 ප්‍රකාශන

මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයන්ගේ ආඥා පනතේ (179 අධිකාරය) 2 වන පරිච්ඡේදය යටතේ 2018 වර්ෂය තුළ ලියාපදිංචි කිරීම සඳහා ලැබී ඇති ප්‍රකාශන සංඛ්‍යාව 10,179කි. එම ප්‍රකාශන සියල්ල ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචි වූ පොත් සංඛ්‍යාව 4046කි. ලියාපදිංචි වූ භාෂාව අනුව, සිංහල 3042 ක්, දෙමළ 751 ක් ඉංග්‍රීසි 157 ක් සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි 96 ක් ලෙස පොත් 4046 ක එකතුවක් ලියාපදිංචි කර ඇත.

16.4 වාර සඟරා

මෙම වර්ෂය තුළ වාර සඟරා 343ක් ලියාපදිංචි වී ඇති අතර භාෂාවන් අනුව සිංහල 174ක්, දෙමළ 97 ක්, ඉංග්‍රීසි 27 ක් සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි 45 ක් ලෙස වාර සඟරා 343 ක් ලියාපදිංචි කර ඇත.

16.5 ප්‍රවෘත්ති පත්‍ර

ප්‍රවෘත්ති පත්‍ර ආඥා පනතේ (180 අධිකාරය) 2 වන ඡේදය යටතේ 2018 වර්ෂය තුළ ප්‍රවෘත්ති පත්‍ර 325ක් ලැබී ඇත. ලැබුණු පුවත්පත් භාෂාව අනුව සිංහල 192 ක්, දෙමළ 81 ක්, ඉංග්‍රීසි 48 ක්, සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි 04 ක් ලෙස ප්‍රවෘත්ති පත්‍ර 325 ක් ලැබී ඇත.

17. මහනුවර ශාඛාව

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මහනුවර ශාඛාව හේමමාලී මාවතේ පැරණි උසාවි සංකීර්ණයට සම්බන්ධව පිහිටා ඇත.

17.1 සේවක සංඛ්‍යාව

මහනුවර ශාඛා කාර්යාලයේ සහකාර ලේඛනාරක්ෂක, ලේඛනාරක්ෂක නිලධාරි, සංවර්ධන නිලධාරීන් තිදෙනෙකු සහ කාර්යාල සේවක සේවයේ සේවක මහතුන් තිදෙනෙකු සමාලෝචනයට බඳුන් වන වර්ෂය තුළ සේවයේ නියුතු විය.

- ලේඛනාරක්ෂක නිලධාරි ලසිකා ආරියරත්න මෙනවිය 2018.06.01 දින සිට ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර ඇත.

- ලේඛනාරක්ෂක නිලධාරි ශ්‍රියාණි රණසිංහ මිය 2018.06.04 දින සිට මහනුවර ශාඛාව වෙත අනුයුක්ත කර ඇත.
- සංවර්ධන නිලධාරි අනූෂා රාජපක්ෂ මිය ප්‍රසූත නිවාඩු අවසන් වී 2018.02.02 දින සිට යලි සේවයට වාර්තා කර ඇත.

17.2 ලේඛන සඳහා සුචි සැකසීම

- ලේඛන කාණ්ඩ 18 (මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය) 9712–10526 දක්වා සුචිය සකස් කිරීම
- ලේඛන සඳහා අවසන් අංක යෙදීම

ලේඛන කාණ්ඩ අංකය	විස්තර	ප්‍රමාණය
30	කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3206 – 3754
34	මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	1891 – 3132

- ලේඛනවල පිරික්සුම් ලැයිස්තු (check list) ගැනීම

ලේඛන කාණ්ඩ අංකය	විස්තර	ප්‍රමාණය
18	මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	1 – 10526
30	කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	1 – 3754

- Location Guide සකස් කිරීම

කෝෂ්ඨාගාරය	ලේඛන කාණ්ඩය	ලේඛන ප්‍රමාණය
01	78	1-5466
	80	1-788
	83	1-3936
	245	1-1464
	276	1-5300
	305	1-1141

කෝෂ්ඨාගාරය	ලේඛන කාණ්ඩය	ලේඛන ප්‍රමාණය
02	18	1-6382
		9090-9122
		9344-10256
	20	1-1981
	30	1-3754
	34	1-2563
	38	1607-2991
	69	1-1402
	220	2071-12083
	236	1-2224
03	18	6383-8992
		9123-9344
	21	1-175
	23	1-47
	83	3936-6610
	220	1-2070
	253.65	1-37
	අති විශේෂ ගැසට්	වර්ෂ 2007-2011
	චක්‍රලේඛ	1959-1970

- සුචි පරිගණකගත කිරීම

ලේඛන කාණ්ඩ අංකය	විස්තර	ප්‍රමාණය
ලේඛන කාණ්ඩ 30	කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	2255 – 2850
ලේඛන කාණ්ඩ 18	මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සෙවීම් උපකෘත	9345-10526
---	සැසි වාර්තා සුචිය	වර්ෂ 1861-1978

17.3 උසාවි සඳහා ලේඛන ඉදිරිපත් කිරීම

කෑගල්ල දිසා අධිකරණය, මාතලේ දිසා අධිකරණය, අවිස්සාවේල්ල දිසා අධිකරණය සහ මහනුවර දිසා අධිකරණය වෙත ලේඛන සහ සහතික කරන ලද උද්ධෘත ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

17.4 ලේඛන සමීක්ෂණ සහ වැඩමුළු

කඩුගන්නාව නගර සභාව, මහනුවර නගර සභාව, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ වත්තේගම නගර සභාව යන ආයතනවල ලේඛන සමීක්ෂණ දියත් කරන ලදී. තව ද, ලේඛන කළමනාකරණය හා සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ නීති රීති) යන වැඩමුළුව පවත්වන ලදී. ඊට අමතරව කොළඹ කාර්යාලයේ පවත්වන පස්දින පාඨමාලාවේ දේශනයක් (ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය) පවත්වන ලදී.

17.5 මහජන විමසීම්

- නිකුත් කළ ලේඛන ප්‍රමාණය

ඉල්ලුම්පත් වර්ගය	ඉල්ලුම් කළ ප්‍රමාණය	පිටපත් නිකුත් කළ සංඛ්‍යාව
ප්‍රවේණි පංගු (S.T.R)	97	57
ධාන්‍ය බදු (G.T.R)	12	02
විහාර හා දේවාල ඉඩම් ලේඛන (T.L.R)	48	17
කොමසාරිස් වාර්තා (T.L.C.P)	12	04
සන්නස්	24	11
රජයේ ගැසට්	56	29
පනත්	23	09
පිඹුරු	05	01
දේශීය විමසීම්	106	95
විදේශීය විමසීම්	11	09

- පර්යේෂණ කටයුතු සඳහා පැමිණි පර්යේෂකයන් ගණන - 99
- පැමිණි පාඨකයන් - 462
- පරිශීලනය සඳහා නිකුත් කළ ලේඛන ප්‍රමාණය - 819

17.6 ලේඛන අංකිතකරණය

2018 වර්ෂය තුළ දී මහනුවර ශාඛාවේ පළමු වරට ලේඛන අංකිතකරණ කාමරයක් පිහිටුවා ගත් අතර වටිනාම ලේඛනම ප්‍රමුඛත්වය ලබා දෙමින් අංකිතකරණය ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

18. නීති සම්පාදනය

1885 අංක 1 දරන මුද්‍රණ ශිල්පීන් හා ප්‍රකාශකයන් පිළිබඳ ආඥා පනත සංශෝධනය කිරීමේ කාර්යය 2018 වර්ෂයේ දී නැවත ආරම්භ කරන ලදී. මේ සඳහා මූලික සාකච්ඡා ජාතික පුස්තකාලය සමඟ පවත්වන ලදී. තව ද, ජාතික පුස්තකාල උපදේශක කමිටුව විසින් සංශෝධන සඳහා නිර්දේශ ලබා දීම සඳහා ජාතික පුස්තකාලයේ අධ්‍යක්ෂ ජනරාල් ඩබ්. සුනිල් මහතා, ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය නදීරා රූපසිංහ සහ ජාතික පුස්තකාලයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් උපාලි අමරසිරි මහතාගෙන් සමන්විත ත්‍රී පුද්ගල කමිටුවක් පත් කර ඇත.

19. පොදු කරුණු

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ජාතියේ ලිඛිත උරුමය ආරක්ෂා කරමින් රාජ්‍ය හා මහජන අවශ්‍යතා අනුව තොරතුරු ලබා දෙන රාජ්‍ය ආයතනයකි.

ජාතික ලේඛනාගාරයේ ප්‍රධාන අරමුණ වන්නේ රාජ්‍ය පාලකයන් විසින් අතීතයේ සිට නිර්මාණය කරන ලද වැදගත් ලේඛන සංරක්ෂණය කර ආරක්ෂිතව තැන්පත් කරමින් රාජ්‍ය පාලනයේ දී මෙන්ම මහජන අවශ්‍යතා අනුව අවශ්‍ය තොරතුරු ලබා දීමයි. ඒ අනුව මෙම වර්ෂයේ දී මහජනතාව, පාසල් සිසුන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා විවිධ වෘත්තිකයන් මෙන්ම විදේශිකයන්ට ද අවශ්‍ය තොරතුරු ලබා දෙමින් පර්යේෂකයන් 3163 කට ආසන්න ප්‍රමාණයකට පර්යේෂණ පහසුකම් ලබා දීමට හැකිවීම මඟින් ජාතික ලේඛනාගාරය පර්යේෂකයන්ට සුවිශේෂ තැනක් වූ බව තහවුරු වේ. දෙපාර්තමේන්තුවේ අවම පහසුකම් හා අවම නිලධාරී පිරිසක් මඟින් මෙවැනි උපරිම සේවයක් ලබාදීමට ගත් උත්සාහයේ දී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය ඉමහත්ය. කෝෂ්ඨාගාර කාර්යන් වල දී පෙර වර්ෂයන් වලට වඩා සාර්ථක ක්‍රියාකාරී කාර්යන් වැඩි ප්‍රමාණයක් ඉටු කිරීම ද පැසසිය යුතු කරුණකි.

රාජ්‍ය ආයතන 29ක ලේඛන සමීක්ෂණය කරමින් ලේඛන කළමනාකරණය, සංරක්ෂණය සහ ලේඛන අපහරණය මෙන්ම ජාතික ලේඛනාගාරයට ආබද්ධ වන ලේඛන පිළිබඳව රාජ්‍ය ආයතන දැනුවත් කිරීම තුළින් මෙම වර්ෂයේ රාජ්‍ය ආයතන වෙතින් මුල් ලේඛන සහ ප්‍රකාශන 6997ක් ආබද්ධ කර ගැනීමට හැකිවීම අප ලැබූ සාර්ථක ඉදිරි පියවරකි.

දෙපාර්තමේන්තුවේ ඉහළ පුරප්පාඩු ප්‍රමාණයක් පැවතීම, වෘත්තීමය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට බාධාවක් විය. බඳවා ගැනීම් ක්‍රියාවලියට යම් කාලයක් ගතවන හෙයින් විශ්‍රාම යන නිලධාරීන්ගෙන් ඇතිවන පුරප්පාඩු පිරවීම ද කඩිනමින් කර ගැනීමට නොහැකි වීම කණගාටුවට කරුණක් විය. වර්තමාන හා අනාගත අවශ්‍යතාවයන්ට අනුව කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්ය සම්පූර්ණ කිරීමට ගත් උත්සාහය සාර්ථක වීම සතුටට කරුණකි. තව ද මේ සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් ලද අනඟි සහාය හා වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් ද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ද ලද සහයෝගය ස්තූති පූර්වකව සිහිපත් කළ යුතු ය. බඳවා ගැනීම් පටිපාටි 08 ක් 2018 වර්ෂය අවසාන වන විට අනුමත වී ඇති අතර 2019 වර්ෂයේ දී තනතුරු කිහිපයක් සඳහා බඳවා ගැනීමට නියමිතය.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ දිරාගිය කොන්ක්‍රීට් ෂින්ස් ගලවා ඉවත් කර ප්‍රතිසංස්කරණය කර මධ්‍ය වායු සමන, ගිනි නිවන සහ උසස් ආරක්ෂක පද්ධතීන් ස්ථාපනය කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2018.01.17 දින අමාත්‍ය මණ්ඩල සංදේශ තීරණ අංක අමප/17/2988/742/ 050 මඟින් ලැබී තිබුණු අතර වැඩ පැවරීම සඳහා අදාළ කටයුතු සිදුකරමින් පවතින අතරතුර අප්‍රේල් මාසයේ දී කොන්ක්‍රීට් ෂින්ස් 25ක් හදිසියේ පහලට කඩා

වැටිණි. දිරාගිය කොන්ක්‍රීට් ෆින්ස් ගලවා ඉවත් කර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම කඩිනමින් ආරම්භ කිරීම සිදුකල යුතු වුවත් රේඛීය අමාත්‍යාංශය කිහිප වාරයක් වෙනස්වීම හේතුවෙන් පෙර සකස් කර තිබූ තාක්ෂණ ඇගයීම් කමිටු සංශෝධනයට ලක් කිරීමට සිදුවිය. එම නිසා අදාළ කාර්යය සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීම ප්‍රමාද වූ අතර, 2018.12.26 දින අර්ධ රාජ්‍ය ආයතනයක් වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) සහ එම කාර්යාංශයෙහි පූර්ණ හිමිකාරිත්වය යටතේ ක්‍රියාත්මක ඒ හා අනුබද්ධ ආයතනයක් වන සී/ස මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම (CESL) වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදු විය.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සේවාලාභීන්ට ලබාදෙන සේවාවන් ඉදිරියට ද හැකි උපරිම ආකාරයෙන් ලබා දීමට කටයුතු කරන බව ද මෙහි ලා සඳහන් කරමි.

ආචාර්ය නදීරා රූපසිංහ
ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්